TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 5, Sri Lanka
Tele : (94) 11 4369781
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර, කොළඹ 5

22 ඔක්තෝබර් 2019.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>පහසුකම්, ප්‍රදාන ලබා දීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ හිටපු පෞද්ගලික ලේකම් අතුල කුමාරසිරි මහතාගේ මූලිකත්වයෙන් එක්සත් ජාතික පාක්ෂිකයන් වෙත බීජ පැකට් හා උදළු තල බෙදා දීමක් සතියක පමණ කාලයක් පුරා සිදු වූ බවට තොරතුරු ලැබී ඇත. මෙසේ බෙදා බෙදාහැර ඇත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවි සංවිධාන සාමාජිකයන් වෙත ලබා දීමට තිබෙන බීජ පැකට් සහ උදළු තල බව ද වාර්තා වී ඇත. මීට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත.

මෙසේ මැතිවරණ කාල සීමාව තුළ වගා කටයුතු සඳහා සහනාධාර හා කෘෂි උපකරණ බෙදා දීම මඟින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 6 (iii) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා ඌව පළාත් සම්බන්ධීකාරක අමන්දා පාරමී මෙනෙවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා හෝ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara

ලක්විජය බණ්ඩාර
ජාතික සම්බන්ධීකාරක (PPPR)



